# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 35 දරන
# අගනුවර තරුණ කවි සමාජය
# (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1985 සැප්තැම්බර් මස 03 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**1985 සැප්තැම්බර් මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

**මිළ : ශත 60** **තැපැල් ගාස්තුව : ශත 60 යි**

# 1985 අංක 35 දරන අගනුවර තරුණ කවි සමාජය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1985 සැප්තැම්බර් මස 03 වන දින]

එල්. ඩී.-ඕ. 55/84.

අගනුවර තරුණ කවි සමාජය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"අගනුවර තරුණ කවි සමාජය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබූ හෙයින්ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම්කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන ප්‍රයෝජනය සඳහා වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1985 අංක 35 දරන අගනුවර තරුණ කවි සමාජය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) අගනුවර තරුණ කවි සමාජයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "අගනුවර තරුණ කවි සමාජය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්වී එසේ පැවතිය යුතු ය. තවද ඒ සංස්ථාව විසින්ද එයට විරුද්ධවද එම නාමයෙන් සියලුම අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත හා අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය සහ අධිකාරය සංස්ථාවට ඇත්තේ ය. අගනුවර තරුණ කවි සමාජය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) සිංහල කවියේ සහ සාහිත්‍යයේ සංවර්ධනය වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ආ) සිංහල ලියතුන්ගේ සහ සිංහල කවියන්ගේ ශුභ සාධනය සඳහා සහාය වීම ;

(ඇ) රටේ සංස්කෘතිය හා සභ්‍යත්වය වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) සංගමයේ සාමාජිකයන්ගේ සාහිත්‍යමය කුසලතා හා දැනුම වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

ඒ 078489—6,700 (85/08)

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම, ආධාර මුදල්, පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීම හා සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය සේවක පිරිස සේවයේ යෙදවීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටුකර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීම සහ ඉටුකිරීම සඳහා සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනා කරණය කිරීම.

5. (1) සංස්ථාවේ නිලධාරීන්ගෙන් සහ සංස්ථාවේ තත් කාලයේ වලංගුව බල පවත්නා රීති වලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන සෙසු නැනැත්තන්ගෙන් ද සමන්විත කළමනාකාර මණ්ඩලයක් විසින් එකී රීති වලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේදී ධුර දරන සංගමයේ කළමනාකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් විශ්‍රාම ගැනීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද සංස්ථාව විසින්, කලින් කල, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකදී, ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් රීති සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයෙන් එකී රීති වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සැමවිටම සංස්ථාවේ තත් කාලයෙහි වලංගුව බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු ණය හා සංගමයට අයවිය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයෙහි දී පවතින සංගමයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, සංගමයට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, මුදල්, දායක මුදල් සහ සහභාගි මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ ආදායම හා දේපළ යෙදිය යුතු ආකාරය.

8. සංස්ථාවේ ආදායම සහ දේපළ හුදෙක් සංස්ථාවේ පරමාර්ථ නංවාලීම පිණිසම යොදා ගත යුතු අතර ඉන් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද මුදල් හෝ වෙනත් ලාභ වශයෙන්, කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන මගින්—

(අ) සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන්, සංස්ථාවේ යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට හෝ සංස්ථාවේ යම් සාමාජිකයකුට, සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් ගෙවීම ; සහ

(ආ) තම කර්තව්‍ය හෝ කාර්ය ඉටුකිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ තංවාලීමෙහි ලා, සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් දරන ලද වියදම් ආපසු ගෙවීම,

වළක්වනු නොලැබිය යුතු ය.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නාවූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගෙන තබා ගැනීමට නීතියෙහිලා සංස්ථාවට බලය ඇති අතර, ඒ සියලු දේපළ (ඊට අදාළ යම් භාරයකට සහ ඒ භාරය විධිමත් කෙරෙන යම් නීතියකට යටත්ව) විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. යම් සාමාජිකයකුගෙන් සංස්ථාවට අය විය යුතු යම් දායක මුදලක ප්‍රමාණය ඉක්ම වූ යම් සම්මාදම් මුදලක්, සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා නිදහස් කිරීම සඳහා ගෙවීමට සංස්ථාවේ කිසිදු සාමාජිකයකු බැඳී නැත. සංස්ථාවේ සාමාජිකයන්ගේ වගකීම.

11. සංස්ථාවේ කළමනාකාර මණ්ඩලයේ යෝජනා සම්මතයක බලය යටතේ සහ තත් කාර්යය සඳහා කළමනාකාර මණ්ඩලය විසින් යථා පරිදි බලය පවරනු ලැබූ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනා පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම තම අත්සන් කළ යුතුය. තවද, එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

12. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලුම ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කරනු ලැබීමෙන් පසු, කවර වුවද දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ යම් ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදාදීම ස්වකීය රීති මගින් තහනම් කර ඇත්තා වූ වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරින දිනයේදී හෝ විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ නියාදනය කිරීම.

ඊට පෙරාතුවම පවත්වනු ලබන සංස්ථාවේ රැස්වීමකදී සංස්ථාවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් හෝ, එසේ නොවන්නේ නම්, ඒ දේපළ නැතහොත් ඉන් යම් කොටසක් පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත සංස්ථාවේ කළමනාකාර මණ්ඩලය විසින් කරනු ලබන ඉල්ලීමක් මත ඒ අධිකරණය විසින්, එකී සංගමය හෝ සංගම් කවරේදැයි තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.